

## වෙසක් දිනේ !

මල් කඩලා පන්සල් යමු
පූජකරමු වැඳගෙන ඉමු
වෙසක් දිනේ හඳහාමී
එළිය ගෙනෙන්නේ
වෙසක් කූඩු තොරණ් බලයි
සෙනග රැස්වෙලා
ගම නගරය හැම තැනකම
එළිය පැතිරිලා
බුදු සමිඳුගෙ පින් මහිමය
මිනිස් සිතේ ඉතිරිලා
සාමයෙ මල් පොකුරු පොකුරු
දසත පිපේවා!

***ෂෙහාන් මධුශංඛ ද සිල්වා***
***බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලය***
***බෝමිරිය* Sri Lanka**




Children's Corner

## Ice Cream අයිස් ක්‍රීම්



The history of Ice-cream can be traced back to the fourth century BC. Emperor Nero in the first century AD refers to it in his writings. But it really took off in China in the court of Tang, in the seventh century. Sailors brought it to Europe and, in 1848, in the US, William Young patented the hand-cranked freezer, a process still used today.

**අ**යිස් ක්‍රීම් ඉතිහාසය ක්‍රිස්තු පූර්ව හතරවෙන් සියවස දක්වා යයි. ක්‍රි.ව.1 දී නීරෝ අධිරාජයා තම ලියවිලිවල අයිස්ක්‍රීම් ගැන සඳහන්කර ඇත. නමුත් එය ජනප්‍රිය වූයේ හත්වන ශත වර්ෂයේ චීනයේ ටැන් රජුගේ රජ වාසලෙනි. නාවිකයෝ අයිස්ක්‍රීම් චීනයෙන් යුරෝපයට ගෙන ආහ. 1848 දී ඇමරිකාවේ විලියම් යං නමැති අය ප්‍රථම වරට අතින් කරකවන අයිස් පෙට්ටියක් සාදා එමගින් අයිස් ක්‍රීම් සාදන්නට විය. අදත් භාවිතා වන්නේ ඒ ක්‍රමයයි.

♦ ***Auntie Ramani ( රමණී නැන්දා )***

## දෙමාපිය වන්දනා

මල් කැකුළක් වෙන්න මා සිතු පැතු ලෙසට
මව්පියෝ දිරිය ඉන්නා මල් කැකුළ කට
පින් දෙන්නට ඉඩක් ඇද්දැයි බැලූ විට
තිබුණා ඔබේ උණුසුම මා පැතු ලෙසට

ඔවදන් ලබා දී මගෙ මව් පිය ලෙස ට
ගුණ නැණ වඩා නොඅඩුව දුන් ශිල්පයට
කළගුණ සලකන්න සිතුවෙමි මේ ලෙස ට
සැමදා පතන්නෙමි දිගුකල් වැජඹෙන් ට

♦ ***එම්. විශ්වා නිර්මාණී***
***ශ්‍රී ධර්මානන්ද විද්‍යායතන පිරිවෙණ***
***බළංගොඩ* Sri Lanka**

## කුරුල්ලෝ

පාට පාට කුරුල්ලෝ
හරි ලස්සන කුරුල්ලෝ
අපේ ගෙදර වත්ත උඩින්
පියඹා යන කුරුල්ලෝ

කැටපෝලෙන් විදිනවාට
ගල්කැටයෙන් ගසනවාට
අපිව දාල යන්න එපා
අපිට ඕන කුරුල්ලෝ

ගස්වැල් වල මල් පිපෙන්න
මලි පිපිලා ගෙඩි හැදෙන්න
නුඹ නැතිදා බැරිවෙනවා
එහෙම නේද කුරුල්ලෝ

මේ ලොව
ලස්සන කරන්න
ඔබ නැතිදා
මගක් ඇද්ද
ඔබ නැතිදා
ලොවක් නැතිලු
රැකගමු අපි
කුරුල්ලෝ

♦ ***එච්. ඩබ්. උදාර පැතුම්***
***සාන්ත තෝමස් කුමර විදුහල***
***මාතර* Sri Lanka**


# නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

## BANK OF CEYLON (UK) Ltd.

ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
## දැන් විවෘතයි...!

- ඉතිරිකිරීමේ ගිණුම්
- ජංගම ගිණුම්
- ස්ථාවර තැන්පතු
- ළමා ඉතිරිකිරීමේ ගිණුම්
- ආයතනික ගිණුම්
- ලංකා බැංකු ගිණුම් හිමියන් සඳහා නොමිලේ මුදල් පැවරුම්
- පුද්ගලික හා ආයතනික ණය පහසුකම්
- ආනයන/අපනයන මූල්‍යකරණය
- භාන්ඩාගාර සේවාවන්
- විදේශ විනිමය සේවාවන්
- සංචාරක කටයුතු සඳහා බැංකු සේවාවන්

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
info@bankofceylon.co.uk Fax: 020 7377 5430
Email : bankofceylon.uk@btclick.com Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD




# 50 වතාවක් ලේ දන්දීමට රන්පදක්කමක්



***අසෝකා ජයලත් මහත්මිය***



රන් පදක්කම

**ලේ** පරිත්‍යාගය සියළු දාන අතුරෙන් ධර්මදානය තරමටම උසස් දානයක් බව අප අහලා තියෙනවා. ඒ ලේ දන්දීම අනතුරට භාජනය වුණු ජීවිත බේරාගන්න මහෝපකාරී වෙනවා. ලේ දන්දීම එතරම් උතුම් කාර්‍යයක් නම් පණස් වතාවක් ලේ දන්දීම සුළුපටු පිනක් නොවේ. එපමණ වාර යක් ලේ දන් දෙන්නට හැකිවූ අය ලෝකෙ හරි අඩුයි.

පණස් වතාවක් ලේ පරිත්‍යාග කළ ලන්ඩනයේ වෙසෙන ශ්‍රීලාංකික කාන්තාවක් අපට මුණගැහුණා. ඇය නීස්ඩන් හි පදිංචි අසෝකා ජයලත් මහත්මිය. ඒ මහඟු ප්‍රජා සත්කාරය වෙනුවෙන් මහා බ්‍රිතාන්‍යයේ ජාතික රුධිර සේවා ආයතනය ( National Blood Service in the UK ) විසින් අසෝකාට රන්පදක්කමක්ද ප්‍රදානය කරලා තිබෙනවා. ඒ රන්පදක්කම සමග තවත් වෛද්‍යපහසුකම් රැසක් ද ඇයට ලැබිලා තියනවා.

අසෝකා ශ්‍රීලංකාවෙ දනට පිනට ලැදි පවුලකින් පැවත එන කෙනෙක්. ඒ දෙමාපියන් නිසාම දානමය කටයුතු වලට ඇය හුරුවුණේ ඉතා පුංචි කාලෙදිමයි. මුලින්ම ලේ දන්දීලා තියෙන්නේ ඇයට වයස **18** දී බටහිර ලන්ඩනයේ Willesden College of Technology නම් ඇය ශාස්ත්‍ර හදෑරූ ආයතනයට දිනක් ලේ බැංකුවෙ වාහනයක් ඇවිත් එහි සිසු සිසුවියන්ට හා ගුරුවරුන්ට ලේ දන් දෙන්නට අවස්ථාවක් සැලසූ විටයි. එතැන් සිට ඇය නොකඩවා හැම වසරකම පාහේ වසරකට වරක් නොව කීප වරක්ම ලේ පරිත්‍යාග කළා.

අසෝකා වරක් අපට පැවසූ පරිදි ඇය ලේ දන්දීමේ වටිනාකම මනාව වටහාගත්තෙ තම ආදරණීය සැමියා බරපතළ ලෙස රෝගාතුරව රෝහලේ සිටි අවස්ථාවේදියි. ඇය ඔහු වෙනුවෙන් ලේ පයින්ට් **18** ක් දී තිබෙනවා. එමගින් ඔහු පියවි ලෝකයට යළි ගන්නට හැකිවීම ගැන ඇය අප්‍රමාණ සංතෝෂ වෙනවා. මේ අයුරින් ඇරඹුණු ලේ පරිත්‍යාගය **50** වාරය දක්වාම ගියා. ලන්ඩන් බෞද්ධ විහාරයේ සෑම ලේ පරිතයාාග දිනයකදී ඇය අනිවාර්ය-යෙන්ම එහි සිටිනවා අප දකිනවා.

අසෝකා හා ජයලත් යුවළගේ දියණියන් දෙදෙනා-ටද බොහෝ වාර ගණනක් ලේ දන්දීම වෙනුවෙන් ලෝකඩ පදක්කම් හිමිව තිබෙනවා. දැන් අසෝකාගේ අරමුණ ලේ දන්දීමේ **100** වෙනි ඉලක්කය කරා යන්නටයි. එය නිසැක වම ඉටුවනු ඇති බව අපට විශ්වාසය. අපි ඇයට නිදුක් නිරෝගී දිර්ඝ ජීවිතයකට ආසිරි පතමු! - ***වෙනුර***

# අවමංගල්‍ය Obituary



### * * * * කිවිපතිනි * * * *
# නන්දා හැගොඩ මහත්මිය

**කොළඹ** යුගයේ සුප්‍රකට කිවිවරයෙකු වන දිවංගත විල්සන් හැගොඩ මහතාගේ ආදරණීය බිරිඳ වූද, ලාල්, පාලිත, නාලිනී, ශ්‍රීමතී, අනුර සහ ප්‍රදීපාගේ දයාබර මෑණියන් වූද, නැසීගිය රන්ජිත් පලන්සූරිය, ආරිය බණ්ඩාර සමරකෝන්, රියෙන්සි මදුරප්පෙරුම, ලලනා, පුෂ්පා සහ අනෝමාගේ අදරැති නැන්දනිය වූද, ***කිවිපතිනි නන්දා හැගොඩ මහත්මිය*** වසර **89** ක් ආයු වළඳා **2011** මැයි මස **2** වන දින අභාවප්‍රාප්ත වූවාය. ආදාහන කටයුතු කොළඹ බොරැල්ල සුසාන භූමියේදී මැයි **5** වන ගුරු දින සිදුවිය.

**1922** මැයි මස **20** වන දින කොළඹ රාජගිරියේ උපත ලත් නන්දා හැගොඩ මහත්මිය සිය සැමියා වන බොහෝ කලක් අගනුවර තරුණ කවි සමාජයේ සභාපතිධූරය ඉසිලූ විල්සන් හැගොඩ මහතා හඳුනාගන්නා ලද්දේ කවියට ඇති ඇල්ම නිසාමය. ඔව්හු **1942** වසරේදී විවාහ වූහ. වෘත්තියෙන් ගුරුවරියක වූ ඇය කොළඹ යුගයේ ප්‍රභාමත් කිවිඳියන් අතර බැබළුණු තාරකාවකි.

කවියට ඇල්ම ඇති ශ්‍රීලංකාවේ කාන්තාවන් ඒකරාශි කරනු පිණිස ඇරඹූ ‘ශ්‍රීලංකා කවි කාන්තා කලා සංගමයේ’ ආරම්-භක ලේකම්වරිය වූයේ නන්දා හැගොඩය. එසේම **1950** වසරේදී ශ්‍රී ලංකාවේ දීපව්‍යාප්ත ‘කෝකිල හටන’ නම් කවිසංවාද ඇරඹූයේ ද ඇයයි.

සිංහල කවියට ඇයගෙන් සිදුවූ ඉමහත් සේවය අගයනු වස් අගනුවර තරුණ කවි සමාජය විසින් කලකට ඉහත පිරිනමන ලද **කිවිපතිනි** යන කාව්‍ය ගෞරව සම්මානයෙන් නන්දා හැගොඩ මහත්මිය පිදුම් ලැබුවාය. ඇය ගේත් විල්සන් හැගොඩ කිවිවර යාගේත් ආභාෂය ලත් හැගොඩ පවුලේ දරුවෝ අද කිවිවරුන් ලෙස නමක් ගෙන සිටිති.

කිවිකමට සරිලන පරිදිම සෞන්දර්යයෙන් පිරුණු කාරු-ණික සිතක් මෙම කිවිඳිය වෙත නිසගයෙන් තිබුණි. එසේම ඇය අවසන් මොහොත දක්වාම තම දරුවන්ගේ ආදරය සහ සැලකුම් නොමඳව ලැබුවා ය.

නන්දා හැගොඩ කිවිඳියට උතුම් වූ නිවන් සුව අත්වේවා !

♦ ***දයා***


**Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි**
**www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk**